# තිරසාර සංවර්ධනය සහ ග්‍රාමීය ආර්ථිකය



මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සැකසුම

පි.ඩබ්.චතුරිකා චන්ද්‍රසේන

සංවර්ධන නිලධාරි

## 01.හැඳින්වීම.

මනුෂ්‍ය වර්ගයාගේ පමණක් නොව සියලු ජීවීන්ගේ යහපැවැත්ම මෙන්ම සොබාදහමේ ජෛව හා රසායනික ක්‍රියා හා ප්‍රතික්‍රියා වල අඛණ්ඩභාවයේ වැදගත්කම හා අවැසි බව පිළිබඳව අද ලෝක තලයේ අවධානය යොමු වී තිබේ .ඊට සමගාමීව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් වර්ෂ 2015න් ඇරඹුන වසර 15 සඳහා වූ සංවර්ධන න්‍යාය පත්‍රය Transforming Our World: 2030 Agenda for Sustainable Development නමින් 2015 සැප්තැම්බර් මස 25 වන දින සම්මත කර ගන්නා ලදි. පරමාර්ථ 17 කින් සහ ඉලක්ක 169 කින් යුතු එකී සංවර්ධන න්‍යාය පත්‍රය මිහිමත දිළිඳුකම හා කුසගින්න තුරන් කිරීම, ලෝකවාසීන්ගේ සෞඛ්‍ය හා අධ්‍යාපන තත්ත්වයන් නඟා සිටුවීම, ඔවුන් අතර සමානාත්මතාව තහවුරු කිරීම හා දේශගුණික විපර්යාස හමුවේ ලෝකවාසීන් මුහුණ පා ඇති අභියෝග ජය ගැනීම යනාදී වටිනාකම් රැසක් ප්‍රමුඛතා ගත කරනු ලබයි . එමඟින් එතෙක් මනුෂ්‍ය . . වර්ගයා පමණක් නොව සසිවුපාවා, ගහකොළ, ඇළ දොළ, ගංගා, සමුදුරු, කෙත්වතු, වැව් අමුණු ඇතුලු ස්වභාවික හා මිනිසා තැනූ සම්පත් සියල්ලේ පැවැත්ම දෙවෙනි කොට කළ කී දෑ පසෙකලා සංවර්ධන ක්‍රියාදාමයට බොහෝ වටිනාකම් එකතු කිරීමේ වගකීම සාමාජික රටවල් වෙත පවරමින් ලෝකය වඩාත් හොඳ අතට පරිවර්තනය කළ හැකි ගමන් මඟක ඇරඹුම සනිටුහන් කර තිබේ., වසර 2010 දී පහළ මධ්‍යම පන්තියේ ආදායම් උපයන රටක් ලෙස කාණ්ඩ ගත කෙරුණු ශ්‍රී ලංකාව එකී වගකීම ඉටු කිරීමට, එසේත් නැත්නම් වසර 2030 වනවිට වඩාත් යහපත් ශ්‍රී ලංකාවක් තනන්නට සමත් විය යුතුව තිබේ.

“තිරසර යුගයක” ඇරඹුම නිල වශයෙන් සනිටුහන් කරන්නේ 2017 ජනවාරි මස තෙවන දින ය. දිළිඳුකම තුරන් කිරීම තිරසර සංවර්ධනයේ මුඛ්‍ය පරමාර්ථය වේ. ඊට සමගාමීව 2017 වසර “දිළිඳුකම තුරන් කිරීමේ වසර” ලෙස නම් කෙරේ. ජාතික තලයේ අඩු දරිද්‍රතා මට්ටම නිර්ණය වන්නේ ජන ජීවිතය අති දුෂ්කර ග්‍රාමීය අංශයේය.

ශ්‍රී ලාංකීය ආර්ථික ව්‍යුහයේ විශාලතමයා වූ ග්‍රාමීය අංශය තුළ තිරසර සංවර්ධන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ ලා වැදගත් වන කරුණු කීපයක් මෙම වාර්තාවෙන් අවධානයට නතු වේ.

## 02.තිරසර සංවර්ධනය

තිරසාර (ධරණීය) සංවර්ධනය යනු මූලිකවම පරිසරයේ පවත්නා සම්පත් වලින් ප්‍රයෝජනය ගන්නා අතරම අනාගතය සඳහා ද ඒවා සුරැකීමයි. මේ අනුව ධරණීය සංවර්ධනය යන්නෙන් පවත්නා සම්පත් වර්තමානයේ ප්‍රයෝජන ගැනීම, ඒවා සංවර්ධනය කිරීම මෙන්ම, අනාගත පරපුරේ අවශ්‍යතාවයන් සඳහා ද ඒ සම්පත් යම් ප්‍රමාණයකට ආරක්ෂා කිරීමත් අදහස් වේ. අනාගතය සඳහා සම්පත් සුරැකීමේදී යම් ප්‍රමාණයකට හෝ වර්තමාන අවශ්‍යතා කැප කිරීමට සිදුවිය හැකිය.

ධරණීය සංවර්ධනය පිළිබඳ සංකල්පය සකස් වී ඇත්තේ විරාත් කාලයක් තුළ එකිනෙකට ප්‍රතිවිරුද්ධ දෙසට ඇදී ගිය ධාරා දෙකක් එක් පොදු දිශාවකට යොමු වීම මගිනි. ඒවා නම් මානව කේන්ද්‍ර ගත භෞතික සංවර්ධනය පිළිබඳ චින්තන ධාරාව හා ජෛව කේන්ද්‍රගත වූ පරිසරය සංරක්ෂණය පිළිබඳ චින්තන ධාරාවන්ය. පශ්වාත් යුධ සමයේ දි ඌන සංවර්ධිත ලෝකය යනුවෙන් හැඳින්වුණු වත්මන් තුන්වන ලොව රටවල් කාර්මිකරණය කිරිම පිළිබඳ ප්‍රශ්නය සංවර්ධනය යනුවෙන් හඳුන්වන ලදි.එහිදී කැපී පෙනුන මූලික ලක්ෂණය නම් ඌණ සංවර්ධිත ලෝකය සංවර්ධනය කිරිම යනු සංවර්ධිත රටවලටම ආවේනික කාර්මිකරණයේ අනුරුවක් බවට පත් විය යුතු බව විනා තෙවන රටවල පරිසර, සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්වයන්ට ගැලපෙන සංවර්ධනයක් විය යුතු බව අදහස්

නොවීමයි. සංවර්ධිත රටවල් අනුගමනය කෙරුනු දේශපාලන මතවාද සංවර්ධනය වෙමින් පවතින රටවලට බලපෑවේ විවිධාකාර ලෙස වුවද සංවර්ධනය පිළිබඳ සමස්ත චින්තනයම හුදු ආර්ථික පාරාමිතින්ම පදනම් කර ගත් එකක් බව පොදුවේ දක්නට ලැබේ. අනෙක් අතට පාරිසරික චින්තනය ඇසුරින් මතුවී ආ ප්‍රධාන කරුණ වුයේ සංවර්ධිත රටවල කාර්මිකරණය තුල ඇති වු විපත් පිළිබඳව කතා කිරීමයි.එබඳු තත්වයක් සංවර්ධනය විරෝධී එකකි. මේ තත්වය යටතේ මෙම චින්තන ධරා දෙක එකිනෙකට ප්‍රතිවිරුද්ධ විය. සංරක්ෂණවාදීන් ගත් කළ සංවර්ධනය විරෝධීන් වශයෙන් සංවර්ධනය පරිසරයේ සතුරෙකු ලෙසද සිතිමට තරම් අන්තගාමී තත්වයකට ඔවුන්ගේ එම චින්තනයන් සකස් වී තිබුණි.මෙම අන්තගාමී තත්වයන් දෙකෙහිම සාරය මුසු කොට ගත් විසඳුමක් කරා යොමු විමට ධරණීය සංවර්ධනය නම් සංකල්පය බිහිවිනි. (විකීපිඩියා)

## 03.ග්‍රාමීය ආර්ථික සංවර්ධනය

ග්‍රාමීය ජනතාව ආර්ථිකව නගා සිටුවීම සඳහා ග්‍රාමීය කුඩා කර්මාන්ත සංවර්ධනය කිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම මූලික කර ගනිමින් වැඩ සටහන් සංවිධානය කිරීම ග්‍රාමීය ආර්ථික සංවර්ධන අංශය මගින් සිදු කෙරේ. මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති කිහිපයකි.

1. කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය
2. මැටි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය
3. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම
4. ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන

### I. <u>කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය</u>

දිවයිනේ කිතුල් කර්මාන්තය ව්‍යාප්ත වී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හඳුනා ගනිමින් කිතුල් කර්මාන්තය ආශ්‍රිත රැකියාවන්හි නියුතු කිතුල් මල් මදින්නන්, නිෂ්පාදකයන් හා ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. ඒ අනුව කිතුල් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන්,තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම, උපකරණ ලබා දීම, නව නිෂ්පාදන හඳුන්වාදීම, වෙළඳපොළ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සහය ලබා දීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. මාතලේ දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් කිතුල් ආශ්‍රිත නිෂ්පාදන කෙරෙයි. එයින් මාතලේ, මතලාපිටිය, යටවත්ත, ලග්ගල, රත්තොට, උකුවෙල, පල්ලේපොල, රුසිගම ආදි ප්‍රදේශවල විශාල වශයෙන් කිතුල් හකුරු, කිතුල් පැණි නිෂ්පාදනය කරයි.

### II. <u>සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය</u>

දිවයින පුරා විසිර පවතින සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. ඒ අනුව සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණික දැනුම ලබා දීම, වෙළඳපොළ අරමුණු කර ගත් නිර්මාණාත්මක මෝස්තර හඳුන්වා දීම, වෙළඳපොළ අවස්ථා සම්පාදනය කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය, නවීන උපකරණ ලබා දීමට කටයුතු කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ වෙස්මුහුණු කර්මාන්තය, පබළු ආශ්‍රිත නිර්මාණ, දැවමය අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන, බතික් කර්මාන්තය, කම්මල් කර්මාන්තය, උණ ලී ආශ්‍රිත නිර්මාණ, හන කර්මාන්තය, පාපිසි බුරුසු නිෂ්පාදනය, පැදුරු ගම්මාන සංවර්ධනය, ස්වර්ණාභරණ

නිෂ්පාදනය, බීරළු රේන්ද කර්මාන්තය, වර්ණ කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන වැඩි දියුණු කිරිම සඳහා අවශ්‍ය සහය ලබා දේ.

III. <u>මැටි නිෂ්පාදන ගම්මාන සංවර්ධනය</u>

දිවයින පුරා විසිරී පවතින මැටි කර්මාන්තකරුවන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම, වෙළඳපොළ අරමුණු කර ගත් නිෂ්පාදන හඳුන්වා දීම, අඩු ආදායම්ලාභී කර්මාන්තකරුවන් සඳහා උපකරණ ලබා දීම, වෙළඳපොළ අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය මගින්,

- සාම්ප්‍රදායික මැටි වළං කර්මාන්තයේ නියැලි කර්මාන්ත කරුවන් සඳහා පුහුණුව ලබා දීම,

නවීන තාක්ෂණය ලබා දීම සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

- මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා මැටි අඹරණ යන්ත්‍ර ලබාදීම හා විදුලි සකපෝරු ලබාදීම මගින් ගමට තාක්ෂණය ලබා දීම.
- මැටියෙන් තනන ලද ගැස් වළං නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර ,උපකරණ හා අච්චු ලබා දීම.
- මැටි වළං ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා වෙළඳපොළ සහය ලබා දීම සඳහා අලෙවි මධ්‍යස්ථාන හඳුන්වා දීම.
- මැටි කර්මාන්තකරුවන් අලෙවි ප්‍රදර්ශන වෙත යොමු කිරීම තුළින් ඔවුන් දිරිගැන්වීම සඳහා කටයුතු සිදු කරනු ලැබේ.

IV. <u>ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන -</u>

දිළිඳුකම තුරන්කිරීම අරමුණු කරගත් වැඩසටහන් කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කරමින් ග්‍රාමීය ජනතාව නගාසිටුවීම මෙන්ම නාගරික හා අර්ධ නාගරික කලාපවල අඩු අදායම්ලාභී ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම මෙම වැඩසටහන තුළින් බලාපොරොත්තු වේ. මේ යටතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ජීවනෝපය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒ අනුව යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම, බෝක්කු, කුඩා පාලම්, කාණු පද්ධති ඉදිකිරීම් හා නවීකරණය කිරීම, පොදු පානීය ජල සම්පාදනය, පානීය ළිං අළුත්වැඩියා කිරීම, බහු කාර්ය ගොඩනැගිලි හා වෙනත් පොදු ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම වැනි සංවර්ධන ක්‍රියාකාරකම් මෙමගින් සිදුකරනු ලබයි.

එසේම ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම, උපකරණ හා පහසුකම් ලබාදීම, ග්‍රාමීය ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම, උපකරණ, තාක්ෂණය හා පහසුකම් ලබාදීම

ග්‍රාමීය සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමෙහිලා අත්‍යවශ්‍ය සාධක බැවින් ඒ සඳහා මෙම ව්‍යාපෘතිය මගින් අවශ්‍ය සහාය ලබාදේ.

## V. ග්‍රාමීය සංවර්ධනය සඳහා නවමාධ්‍ය යොදා ගැනීම

ගැමි ජනතාවගේ ජීවන රටාව වඩා උසස් තත්වයෙන් ගත කිරීමට අවශ්‍ය පරිදි ආදායම් තත්වය ඉහළ නැංවීම ග්‍රාමීය සංවර්ධනය වේ. ගැමි ජනතාවගේ සංවර්ධනය යනු එදිනෙදා ජීවත්වීමට අවශ්‍ය මූලික අවශ්‍යතා ගැටලුවකින් තොරව සපුරා ගැනීමට අවකාශය සැලසීම බව සැලකිය හැක. ග්‍රාමීය අර්ථිකය තුළ පවතින්නේ පවුල කේන්ද්‍ර කර ගත් පරිභෝජනවාදී ආර්ථික ක්‍රමයකි. කෙමෙන් කෙමෙන් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට දරන උත්සාහයේදී ග්‍රාමීය ආර්ථිකය තවදුරටත් සරල ආර්ථික ක්‍රියාවලීන් මත රඳා පවතින්නේ නැත. පුද්ගල අවශ්‍යතා සංකීර්ණවත්ම ග්‍රාමීය ආර්ථිකයද සංවර්ධන විය යුත්තකි. එසේ නොමැති නම් විවිධ සමාජ ගැටළුවලට මුහුණපාන්නට සිදුවේ. මෙම සමාජ ගැටලුවලට විසඳුම් ලැබීමට නම් ග්‍රාමීය සංවර්ධනය වීම සිදුවිය යුතුය.

ග්‍රාමීය අධ්‍යාපනික සංවර්ධනය ඇති කිරීමට නම් බහුමාධ්‍ය සාක්ෂරතා ඥානය ගැමි දරුවන්ට ලබාදිය යුතුය. මේ හරහා නාගරික තරගකාරී සමාජයක් සමග ගනුදෙනු කිරීමට අවශ්‍ය දැනුම ලැබේ. එමෙන්ම වර්තමාන රැකියා අවස්ථා ලබාගැනීම සඳහා අවශ්‍ය වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමේ හැකියාවද ලැබේ. ගෝලීය සමාජයට ගැලපෙන තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ වෘත්තීය සුදුස්සන් මේ හරහා බිහි වේ. විරැකියාව අවම කිරීම සඳහා නවමාධ්‍ය තාක්ෂණික දැනුම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ගැමි දරුවන්ගේ නවමාධ්‍ය දැනුම ලබාදීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේ. උදාහරණ වශයෙන්,

1. නැණසල ව්‍යාපෘතිය
2. කොත්මලේ අන්තර්ජාල ව්‍යාපෘතිය

ආදිය දැක්විය හැකිය. මෙවැනි ව්‍යාපෘති හරහා විවිධ පරිගණක පාඨමාලා ක්‍රියාත්මක කර නව මාධ්‍ය දැනුම ලබාදේ. පරිගණක ආශ්‍රිත දැනුම ලබා ගැනීමේදී අන්තර්ජාලය භාවිත කරමින් විවිධ රටවල පවතින අධ්‍යාපනික පාඨමාලා මොනවාද යන්න දැන ගැනීමටත් ඒ හරහා විවිධ රටවල අධ්‍යාපනික අවස්ථාවන් ලබා ගැනීමටත් හැකියාව පවතී. නවමාධ්‍ය හරහා විශ්වයටම විවෘත වූ පොදු ක්‍රියාවලියක් අනුගමනය කරන හෙයින් ඒ ඒ රටවලින් අවශ්‍ය දැනුම ලබාගැනීමේ හැකියාව පවතී. ග්‍රාමීය ප්‍රදේශයන්හි අන්තර්ජාලය භාවිතය වැඩිදියුණු කිරීමෙන් ඒ හරහා තමාට ලබා ගත නොහැකි දැනුම් අවස්ථාවන්, රැකියා අවස්ථාවන් රැසක් ළඟා කර ගත හැක. විවිධ වෙබ් අඩවි හරහා මෙම අවස්ථාවන්ට පිවිසිය හැකිය. එමෙන්ම දැනුමට අවශ්‍ය තොරතුරු තිබෙන පිටු හා ඒවා බාගත කර ගැනීමේ හැකියාව නව මාධ්‍ය සතුව පවතී. මේ නිසා ගැමිදරුවන්ගේ අධ්‍යාපනික සංවර්ධනය ඇති කිරීම සඳහා නව මාධ්‍ය දැනුම අත්‍යවශ්‍ය බව පැහැදිලි කරුණකි.

සංවර්ධන ක්‍රියාකාරකම් ගැමි ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා සන්නිවේදන මාධ්‍යක් ලෙස නව මාධ්‍ය යොදා ගැනීම වැදගත් වේ. නව මාධ්‍ය ඉතා කාර්යක්ෂම ලෙස ග්‍රාමිය සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගත හැකිය. ග්‍රාමීය කෘෂිකාර්මික ඥානය ලබා ගැනීමට අන්තර්ජාලය භාවිත කිරීමේ හැකියාව ඇත. විශේෂයෙන් නවබීජ හඳුන්වාදීම, පැළ හඳුන්වාදීම සඳහා ගැමි කෘෂිකර්මාන්තයේ යෙදෙන පුද්ගලයන්ට අවශ්‍ය දැනුම උපදෙස් ලබාදීම සිදු කළ හැකිය. සාම්ප්‍රදායික කෘෂිකාර්මික අදහස් වෙනුවට නව උපක්‍රම, නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් කෘෂිකර්මය දියුණු කර ගන්නා ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීමට හැකියාව තිබේ. මෙහිදී සැලකිය යුතු වැදගත් කරුණක් නම් අන්තර්ජාලය යොදාගත හැකිවන්නේ කෘෂිකාර්මික ඥානය ලබාගැනීමට පමණක් නොවේ. විවිධ ක්ෂේත්‍රයන්ගේ දැනුම ලබාගැනීම සඳහා නව මාධ්‍ය යොදා ගත හැක.

සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය අධ්‍යාපනය පහළ මට්ටමක පවතී. මේ නිසා යහපත් සෞඛ්‍ය පුරුදු චර්යා රටාවන් හැඩගස්වා ගැනීමට එතරම් උනන්දුවක් නොදක්වයි. මේ නිසා දරිද්‍රතාව, ළදරු මරණ අනුපාතිකය වැඩිවීම, මන්දපෝෂණය වැනි ගැටලුවලට මුහුණදීමට ග්‍රාමීය ජනතාවට සිදුවේ. මෙවැනි ගැටලු විසඳා ගැනීම සඳහා ජංගම මාධ්‍යයන් යොදා ගැනීමේ හැකියාව පවතී. ජංගම දුරකථන, සීඩී / ඩීවීඩී තැටි ආදිය යොදා ගත හැකිය.

සමාජ මාධ්‍යයන් භාවිතා කිරීම හරහා ගැමි ජනතාවට හොඳ වෙළඳපොළක් නිර්මාණය කර ගැනීමේ හැකියාව පවතී. වෙළෙන්දන් වශයෙන් මෙන්ම පාරිභෝගිකයන් වශයෙන්ද කටයුතු කිරීමේ හැකියාව පවතී. තමන්ට කිසියම් භාණ්ඩයක් විකුණා ගැනීමට අවශ්‍ය නම් සමාජ මාධ්‍යයන් භාවිත කරමින් එම භාණ්ඩ පිළිබඳ දැන්වීමක් පළකර තමන්ට අවශ්‍ය මිල ගණන් යටතේ එය විකුණා ගැනීමේ හැකියාව මෙන්ම අවශ්‍ය කිසියම් භාණ්ඩයක් මිලදී ගැනීමේ හැකියාවද පවතී.

ග්‍රාමීය සංවර්ධන කාර්යයේ දී නව මාධ්‍ය යොදා ගැනීම වඩාත් කාර්යක්ෂම මෙන්ම වඩා ඵලදායී වන බව මෙමගින් පෙනේ. නමුත් ශ්‍රී ලංකාවේ තවමත් නව මාධ්‍ය ගැමි ජනතාව අතර ඉතා විශාල වශයෙන් ප්‍රචලිතව ඇති බවක් නොපෙනේ. එමෙන්ම 4G තාක්ෂණය ලබාදීම, WiFi කලාප ඇති කිරීම සුහුරු තාක්ෂණය මගින් ග්‍රාමීය ප්‍රදේශයන්ට නව මාධ්‍ය තාක්ෂණයට ප්‍රවේශ විය හැකිය.

ගොවිතැන් විරල අවාරයේදී නගර වෙත සංක්‍රමණය වෙමින් සිය වාර්ෂික ආදායමින් යම් ප්‍රතිශතයක් උපයා ගන්නා ග්‍රාමීය ශ්‍රමිකයන් එකී සංක්‍රමණ තුළින් ප්‍රමාණවත් තෘප්තියක් නොලබන බව ප්‍රායෝගික තත්වයකි. එපමණක් නොව අධි ශීඝ්‍ර නාගරිකරණයේ අනිටු ඵල භුක්ති විඳිමින් සිටිමු. ග්‍රාමීය ශ්‍රම හමුදාව ග්‍රාමීය අංශය තුළම රඳවා ගැනීම වඩාත් යෝග්‍ය වේ. ආර්ථික මිණුම් දඬු ඔස්සේ සංවර්ධනය විග්‍රහ කරන සමාජය මෙම මතය ආර්ථිකය ආපසු හැරවීමක් ලෙස දකිනු ඇත. නමුත් එවැන්නකට ඉඩ සලසා දීම තුළ බොහෝ ආර්ථික හා සමාජීය වටිනාකම් ගැබ්ව තිබේ. ඔවුන් කෘෂිකර්මාන්තයේ තිරසර සංවර්ධනය උදෙසා දායක කර ගැනීමේ මහගු සමාජ මෙහෙවර ඉටු කිරීම තිරසර යුගයක දැක්ම විය යුතු වේ.

## 04. ග්‍රාමීය කෘෂිකර්මාන්තය

ග්‍රාමීය අංශය තුළ තවදුරටත් ජනතාව රඳවා තබා ගන්නට නම් සමාජ ආර්ථික වශයෙන් ඔවුන් ඔසවා තබන්නට සමත් ජීවනෝපායන් ගම තුළ පැවතීම අනිවාර්යය වේ. ගම තුළ සේවාවන් දුබලය. කම්හල් හිඟය. කවර හෝ ගොවිකමක් කරන්නට සෑහෙන ශ්‍රමය හා භූමිය නොඅඩුව තිබේ. ග්‍රාමීය කෘෂි අංශය තුළ සත්‍ය වශයෙන්ම පවතින ගැටලුව ශ්‍රම හිඟය හෝ ඌණ සේවා නියුක්තිය නොව ගොවි ජනතාව වගුරන ශ්‍රමයට නිසි ඵල නොලැබීමයි. හිතන තරම් ඵල නොදරන, වල් අලි, මොණරු වනසන, ගනන් තෙල්, පෝර බීජ , නන්නාදුනන ලෙඩ රෝග, පීදුණු ඵලදාවට මිළක් නැති, වැස්සෙන් නියඟයෙන් බැටකන ගොවිකම තුළ තරුණ පරපුර තිර ලෙස රැඳෙයිද? නොකර බැරිකමට ගොවිකමේ නියැලෙන තරුණ පරපුර අකමැත්තෙන් හෝ නගරය වෙත සංක්‍රමණය වීමේ විකල්පය වෙත එළැඹෙන්නේ එලෙසය. එය ග්‍රාමීය කෘෂි අංශයේ ඵලදායිතාව තවදුරටත් හීන වීමට තුඩු දෙන කරුණකි. කෘෂිකාර්මික සම්පත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස කළමනාකරණය කිරීම තුළින් කෘෂිකාර්මික නිෂ්පාදන පිරිවැය පහත හෙළීම, යෝග්‍ය තාක්ෂණය භාවිතා කිරීම තුළින් වස විසෙන් තොර ආහාර නිපදවීම, අස්වනු ඉහළ නැංවීම, පූදින අස්වැන්න ආරක්ෂා කර ගැනීම, හොඳ මිළකට අලෙවි කිරීම එකී විකල්පයන් වේ.


ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ සඳහන් පරිදි කෘෂිකාර්මික අංශයේ ඌන සේවා නියුක්තියට මෙන්ම කාලීන ශ්‍රම හිඟයට යෝජිත විසඳුමකි යාන්ත්‍රිකරණ භාවිතය. අවශ්‍ය වේලාවන්හිදි දැඩි වෙහෙසකින් තොරව වගා කටයුතු නිම කර ගැනිමට හැකිවේ. නිසි වේලාවට බිම සකසා ගැනිමට

භෝගය වැඩෙද්දී ඉක්මණින් මඩ පොහොර යෙදීමට වර්ෂාවට පෙර අස්වනු නෙළා ගන්නට, යාන්ත්‍රිකරණය උදව් වේ. එමගින් ශ්‍රමය හා කාලය ඉතිරි කර ගැනිමට හැකිවේ. වියදම අඩු වී අස්වනු නෙලා ගත හැකිවේ.

තිරසරභාවයේ තෙවදෑරුම් ප්‍රවේශයට අනුව ආර්ථික ජවය බව හා සමාජීය පිළිගැනුමට අමතරව පාරිසරික ගුණත්වයට ද සමාන තැනක් හිමි වේ. කෘෂිකාර්මික කටයුතු වලදී මෙම සංකල්පය වලංගු වන්නේ වස විසෙන් තොර ආහාර නිපදවීම, භූමිය, ජලය, ජෛව විවිධත්වය ඇතුළු පාරිසරික සම්පත් නොනැසෙන අයුරින් ක්‍රියා කිරීම සම්බන්ධයෙනි. බෝග සායන වැඩසටහන ඔස්සේ ඒකාබද්ධ පළිබෝධ මර්ධන ප්‍රවේශය ප්‍රචලිත කරමින් පරිසර හානිය අවම කරමින්, වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ. ගොවිජන සමාජය විග්‍රහ කරන පරිදි බෝග සායන වල වැදගත්කම දෙයාකාර ය. ව්‍යාපෘති මෙවලමක් වශයෙන් හා එම ප්‍රවේශය කෘෂිකර්මාන්තයේ තිරසාර බව සහතික කිරීම වෙනුවෙන් ලබාදෙන දායකත්වය එකී වැදගත්කම්වේ.

ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය සඳහා අංශ වශයෙන් ලබා දෙන දායකත්වය

01. ප්‍රස්ථාරය




මුලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2019 වර්ෂයේ ග්‍රාමීය අංශයේ කෘෂිකර්මාන්තය 28 % වේ.

ග්‍රාමීය අංශයේ වයස 18 වැඩි ජනගහනය

වගුව01


| දර්ශකය | ග්‍රාමීය |
|---|---|
| 18 වැඩි ජනගහනය | 12,718,560 |
| ශ්‍රම බලකාය වයස් කාණ්ඩය අනුව | 7,118,507 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | 56.0% |
| රැකියාගත ජනගහනය | 6,790,785 |
| සේවා නියුක්තිය අනුපාතය | 95.4 |
| විරැකියා ජනගහනය | 327,722 |
| විරැකියා අනුපාතය | 4.6% |
| ශ්‍රම බල සහභාගිත්වයක් නොමැති | 5,600,053 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2019 වර්ෂයේ ග්‍රාමීය අංශයේ වයස 18 ට වැඩි ජනගහනය 12,718,560 වේ. ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය 6,749,448 වේ. එයින් ස්ත්‍රීන් 2,366,548 වේ. පුරුෂ 4,382,899 වේ.අනුපාතය පිළිවෙලින් 35.1 සහ 64.9 වේ.

ග්‍රාමීය ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය (ස්ත්‍රී/ පුරුෂ භාවය, වයස් කාණ්ඩය)-2019

02. ප්‍රස්ථාරය




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ග්‍රාමීය ශ්‍රම බලකා සහභාගිත්වය ස්ත්‍රී, පුරුෂ භාවය හා වයස් කාණ්ඩය අනුව සලකා බැලූ විට 30-39 වයස් කාණ්ඩයේ පුරුෂ පාර්ශවයේ වැඩි බවක් දක්නට ලැබේ. එය 96.4% කි. දෙවනුව 25-29 වයස් කාණ්ඩය 91.1% වේ.

## 05.ග්‍රාමීය දරිද්‍රතාව

ශ්‍රී ලංකාවේ දිළිදුකම මූලික වශයෙන් ග්‍රාමීයව ගැටලුවක් බවට වර්තමානයේ දී පත් වී ඇත. ලංකාවේ සමස්ත දිළිදු ජනතාවගෙන් 90% කට වඩා සංකේන්ද්‍රණය වී ඇත්තේ ග්‍රාමීය හෝ වතු ප්‍රදේශවලය.

ජන හා සංඛ්‍යාලේඛන සමීක්ෂණ වාර්තා අනුව පුද්ගලයකුගේ මාසික වියදම සඳහා රු.5047/= ක මුදලක් අවශ්‍ය වේ. 2020 (ජුනි) වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව දිස්ත්‍රික්ක 09 ක් දරිද්‍රතා රේඛාවට ඉහළින් ඇති බවත් දිස්ත්‍රික්ක 15 ක් ඊට වඩා පහළ මට්ටමක ඇති බවත්, එක් දිස්ත්‍රික්කයක් සමාන බවත් පෙන්නුම් කෙරේ. දිස්ත්‍රික්ක අතුරින් වැඩිම මාසික වියදම රු. 5478/= ක් කොළඹ දිස්ත්‍රික්කය වන අතර අඩුම මාසික වියදම රු 4752/= මොණරාගල දිස්ත්‍රික්කය වේ.

යෝජනා

- දුප්පත් ජනතාව හදුනාගෙන ඔවුන්ව නිශ්චිත වැඩපිළිවෙලකට යොමු කිරිම.
- බොහෝ දෙනෙක් කෘෂිකර්මාන්තයේ හා ස්වයං රැකියාවල යෙදෙන අතර ණය පහසුකම් ලබා දිම.
- ග්‍රාමීය ප්‍රදේශවල වඩා හොඳ මාර්ග පද්ධතියක් , ප්‍රවාහන පහසුකම්, නව තාක්ෂණ ක්‍රමවේද ඇති කිරිම.
- විශ්‍රාම වැටුප් , ආබාධිත දිමනා, සමෘද්ධි දිමනා, අලාභ වන්දි ගෙවීම් ආදි සමාජය ආරක්ෂණ ආවරණ ලබා දිම.
- ග්‍රාමීය ජනතාවගේ අධ්‍යාපන තත්ත්වය පහළ මට්ටමක ඇති අතර පාසල් පහසුකම් දියුණු කිරිම, පාසල් අතර අසමානතාව දුරලිම, පාසල් අධ්‍යාපනය දිරිමත් කිරිම.
- ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවිම සඳහා ග්‍රාමීය කුඩා කර්මාන්ත සංවර්ධනය කිරිම.
- ග්‍රාමීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීම.

ග්‍රාමීය අංශයේ ස්වයං රැකියා දියුණු කිරිම.

ගෘහ අලංකරණය/ මී කිරි සැදිම/ ගඩොල් නිෂ්පාදනය/ එළු ,හරක් ඇති කිරිම හා කිරි ගැනිම/ සිප්පිකටු වලින් මල් සැදිම/ මැටි භාණ්ඩ නිෂ්පාදන/මැහුම් වැඩ/රස කැවිලි, බයිට් සැදිම/ බිම් මල් වගාව/ සිල්ලර වෙළඳ සැල්/ කුඩා තේ කඩ/ ධාන්‍ය ඇඹරුම් හල්/ගඩොල් සැදිම/පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන/ කොහු හා ඉදල් සැදිම/ කුකුල් පාලනය/ පළතුරු,සිසිල් බිම සැදිම/මදුරු දැල් සැකසිම.

ඒ සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය, ඉඩ පහසුකම් සැපයීම, පුහුණු වැඩ සටහන් පැවැත්විමට කටයුතු කිරිම.

ආශ්‍රිත ග්‍රන්ථ


- පරිසර සම්පත් කළමනාකරණය හා තිරසාර සංවර්ධනය භූගෝල විද්‍යා ප්‍රවේශය- ඒ.එච් ධනපාල
- ශ්‍රී ලංකාවේ පරිසරය හා සංරක්ෂණ විධි - උපාලි වීරක්කොඩි
- ගෝලීය පරිසර අර්බුදය -අමරසේන සඳපාල
- සිංහරාජ සංරක්ෂණය - හර්ෂ ප්‍රනාන්දු
- තිරසර සංවර්ධනය හා සන්නිවේදනය - තිසර කුමාරපේලි